සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 61 S I |
|---|---|---|

## භූගෝල විද්‍යාව

**කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :-**
- **ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතවේ.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**

**අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

01. පෘථිවි තලයේ සිට 80 km න් ඉහළට යන විට හමුවන වායුගෝලීය ස්ථරය .................................................. ගෝලයයි. (අපරිවර්තී/ මෙසෝ/ තාප)

02. ජල චක්‍රය තුළ වැඩිම වාෂ්පීකරණයක් .................................................. වලින් සිදුවෙයි. (සාගර/ වනාන්තර/ ගොඩබිම්)

03. පෘථිවියේ භූ තැටි ප්‍රාවරණය මත .................................................. නිසා චලනය වෙයි. (භ්‍රමණය/ පරිභ්‍රමණය/ සංවහනධාරා)

04. .................................................. නිම්නය ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශයකි. (සින්ධු/ හොවැංහෝ/ සැක්‍රමැන්ටෝ)

05. ශ්‍රී ලංකාවේ වී බිම් ව්‍යාප්තියේ අතරමැදි කලාපයට .................................................. ප්‍රදේශයේ වී බිම් අයත්වේ. (අම්පාර/ කෑගල්ල/ කුරුණෑගල)

06. යකඩ හා වානේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ඩෙට්රොයිට් කාර්මික කලාපය .................................................. රටට අයත් වේ. (රුසියාව/ එක්සත් රාජධානිය/ ඇමරිකා එක්සත් ජනපදය)

07. .................................................. පාෂාණය ආග්නේය පාෂාණයකට උදාහරණ වේ. (ජිප්සම්/ ඩොලමයිට්/ බැසෝල්ට්)

08. ශ්‍රී ලංකාවේ .................................................. ජාතික වනෝද්‍යානයක් ලෙස සලකයි. (ගල්ඔය/ ශ්‍රී පාදය/ රිටිගල)

09. බස්නාහිර හැරුණුකල දෙවන විශාලම ජන සංඛ්‍යාව .................................................. පළාත තුළ ඇතිබව 2012 ජනසංඛ්‍යා වාර්තා පෙන්වා දෙයි. (දකුණු/ මධ්‍යම/ වයඹ)

10. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම් වල දැක්වෙන උතුරු සටහන තුළ (දිශා සටහන) .................................................. උතුර සිතියමෙන් සිතියමට වැඩි කෝණික අගයකින් වෙනස්වෙයි. (ජාල/ චුම්භක/ සැබෑ)

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි "යන්න වටාද, වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

11. නල්ල බාර් තැනිතලාව ආසියා මහද්වීපයේ පිහිටා ඇත. (නි / වැ)

12. ලොව වැඩිවශයෙන් නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය තිරිගු වේ. (නි / වැ)

13. ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනයක් ඇඹිලිපිටියේ ද පිහිටා ඇත. (නි / වැ)

14. මානුෂ සංවර්ධන දර්ශකය නිර්මාණය කිරීම සඳහා ළදරු මරණ අනුපාතිකයද යොදා ගනී. (නි / වැ)

15. නියඟ, උපද්‍රවය දේශගුණික උපද්‍රව ගණයට අයත්වේ. (නි / වැ)

- අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල"අ" සහ "ආ" තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාව අනුව ගැලපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉරමත ලියා දක්වන්න.

16. යපස් නිධි ''අ'' තීරුවේ දක්වා ඇත. එම නිධි අයත් රටවල් ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1 හැමර්සල් වැටිය | A - චීනය |
| 2 ෂන්සි | B - ඕස්ට්‍රේලියාව |
| 3 දාමෝදාර් | C - ඇමරිකා එ: ජනපදය |
| 4 පංච මහා විල් අවට | D - ඉන්දියාව |

i. BADC   ii. ABDC   iii. DABC   iv. CADB   (..............)

17. ශ්‍රී ලංකාවේ පස්වර්ග ''අ'' තීරුවේ දක්වා ඇති අතර ඒවා පිහිටි ප්‍රදේශ ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1 දියළුපස | A - තෙත් කලාපයේ |
| 2 රතු දුඹුරු ලැටසෝල් පස | B - වියලි කලාපය |
| 3 රතු දුඹුරු පස | C - ගංගා නිම්න |
| 4 රතු කහ පොඩ්සොලික් පස | D - මධ්‍යම කඳුකර ප්‍රදේශවල |

i. CDAB   ii. CDBA   iii. CABD   iv. ACBD   (..............)

18. ශ්‍රී ලංකා ජනවර්ග ''අ'' තීරුවේ දක්වා ඇති අතර එම ජනවර්ග අයත් කරගන්නා ප්‍රතිශත ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගලපන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1 සිංහල | A - 11.2% |
| 2 ශ්‍රී ලංකා දෙමළ | B - 74.9% |
| 3 ඉන්දියානු දෙමළ | C - 9.2% |
| 4 ශ්‍රී ලාංකික මුස්ලිම් | D - 4.2% |

i. BDCA   ii. BACD   iii. BADC   iv. BCAD   (..............)

19. ශ්‍රී ලංකාවේ වගා කරනු සුළු අපනයන බෝග ''අ'' තීරුවේ ඇති අතර ඒවා බහුලව වගාකොට ඇති දිස්ත්‍රික්ක ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගලපන්න.

| අ | ආ |
|---|---|
| 1 කුරුඳු | A - මහනුවර |
| 2 ගම්මිරිස් | B - හම්බන්තොට |
| 3 කජු | C - ගාල්ල |
| 4 පැගිරි | D - පුත්තලම |

i. DABC   ii. BADC   iii. CDAB   iv. CADB   (..............)

20. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම් වල පර්යන්ත තොරතුරු 'අ' තීරුවේ ඇති අතර ඒවා පිහිටි ස්ථාන ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගලපන්න.


| අ | ආ |
|---|---|
| 1 සිතියමේ පත්‍ර අංකය | A - ඇතුළු මායිම් තීරුව |
| 2 නිරපේක්ෂ පිහිටීම | B - පහළ වට තීරුව |
| 3 පරිමාණය | C - ඉහළ වට තීරුව |

i. ABC   ii. CAB   iii. CBA   iv. BAC   (..............)

- අංක 21 සිට 26 තෙක් ප්‍රශ්න වල හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

21. පෘථිවියේ කබොල හා ප්‍රාවරණය ................................................ අසන්තතියෙන් වෙන්ක කෙර්.
22. මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටි සානුව ................................................ සානුව වේ.
23. ශ්‍රී ලංකාවේ ඉස්සන්/පොකිරිස්සන් වැනි මසුන් ................................................ ධීවර කර්මාන්තයට අයත් වේ.
24. බොරලැස්ගමුව, මීටියාගොඩ වැනි ප්‍රදේශ ................................................ඛනිජය සඳහා ප්‍රසිද්ධ වී ඇත.
25. රටක ජන සංඛ්‍යාව වෙනස්වීම සඳහා උපත්, මරණ මෙන්ම ................................................ ද බලපායි.
26. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් නිර්මාණය කිරීම සඳහා ................................................ ප්‍රක්ෂේපනය පදනම් කරගෙන ඇත.

● අංක 27 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කරගන්න.




ශ්‍රී ලංකාවේ නගර කිහිපයක ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජන සංඛ්‍යාව - 2011

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2011

27. වැඩිම නාගරික ජන සංඛ්‍යාවක් සිටින්නේ ............................................... නගරයේය.

28. අඩුම නාගරික ජන සංඛ්‍යාවක් සිටින්නේ ............................................... නගරයේය.

29. නාගරික ජන සංඛ්‍යාවෙන් ස්ත්‍රීන් ගේ ප්‍රතිශතය වැඩිම නගරය ............................................... නගරයයි.

30. නාගරික ජන සංඛ්‍යාවෙන් පුරුෂයන් ගේ ප්‍රතිශතය වැඩිම නගරය ............................................... නගරයයි.

● අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.

31. ගොඩබිමෙන් සම්පූර්ණයෙන් වටවූ මුහුදක් වනුයේ,
i. මළ මුහුද  ii. කළු මුහුද  iii. රතු මුහුද  iv. මධ්‍යධරණී මුහුද  (.............)

32. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උද්‍යානයක් පිහිටි ප්‍රදේශයක් වන්නේ,
i. අගුණුකොළපැලැස්ස  ii. ගන්නෝරුව  iii. දඹදෙනිය  iv. හිඟුරක්ගොඩ  (.............)

33. ලෝකයේ කපුපිළි නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක් නොවන්නේ,
i. ටෙක්සාස්  ii. නිව් කාසල්  iii. යැංසි  iv. යොකොගාමා  (.............)

34. ශ්‍රී ලංකාවේ ආපදා කළමණාකරණ චක්‍රය අනුව ආපදාවට ලක්වූ ප්‍රජාවගේ තාවකාලික අවශ්‍යතා ඉටු කිරීම අයත් වන්නේ කුමන අවස්ථාවටද?
i. පෙර සූදානම  ii. ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව
iii. යථාතත්වයට පත්කිරීමේ අවස්ථාව  iv. ආපදාව අවම කිරීමේ අවස්ථාව  (.............)

35. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව සම්බන්ධ මෑතකාලීන ප්‍රවණතාවයක් ලෙස නොගැනෙන ප්‍රකාශය කුමක්ද?
i. වැඩිමහල් යැපෙනන්ගේ ප්‍රතිශත ඉහළ යමින් පවතී.
ii. පහළ යැපෙන්නනගේ ප්‍රතිශත ඉහළ යමින් පවතී.
iii. ජන සංඛ්‍යාව තුළ ස්ත්‍රීන්ගේ ප්‍රතිශත වැඩිවෙමින් පවතී.
iv. යැපෙන්නන්ට වඩා ශ්‍රම බලකායේ ප්‍රතිශතය ඉහළ ගොස් ඇත.  (.............)

36. ශ්‍රී ලංකාවේ කෙරවලපිටියේ ඇති විදුලි බලාගාර වර්ගය වන්නේ,
i. ජල විදුලි  ii. තාප විදුලි  iii. සුළං විදුලි  iv. සූර්ය බලශක්ති

37. ශ්‍රී ලංකාවේ වර්ෂ කීපයක දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය දැක්වීම සඳහා වඩාත් සුදුසු ප්‍රස්තාර ක්‍රමය වන්නේ මින් කුමක්ද?
i. සරල රේඛා  ii. සරල තීරු  iii. බහු තීරු  iv. බෙදූ වෘත්ත  (.............)

38. ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම් වල සංස්කෘතික ලක්ෂණයක් නොවන්නේ,
i. වැව  ii. වගාබිම්  iii. මාර්ග  iv. ඩෙල්ටාව  (.............)

39. 1:50,000 පරිමාණයට අනුව ඇඳි සිතියමක 5cm x 6xm භූමි කොටසක සැබෑ භූමියේ වර්ගඵලය වන්නේ,
i. ව.කිමී 30  ii. ව.කිමී 15  iii. ව.කිමී 7.5  iv. ව.කිමී 3.75  (.............)

40. ආයාතගාමී නිම්න හා තීර්යක් නිම්න ඒකාබද්ධ වීමෙන් නිර්මාණය වන ජල වහන රටාව කුමක්ද?
i. ශාඛීය  ii. වලයාකාර  iii. අරීය  iv. ජාලාකාර  (.............)

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | **61 S II**

**භූගෝල විද්‍යාව** | **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :- ● මෙම ප්‍රශ්න පත්‍රය i සහ ii වශයෙන් කොටස් දෙකකින් යුක්තය.**
**● i කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ), (ආ) හා (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.**
**● ii කොටසින් ප්‍රශ්න හතරක් තෝරාගත යුතුය.**
**● පිළිතුරු සැපයීය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

## i කොටස

ඔබ වෙත සපයා ඇති 1 : 50,000 භූ ලක්‍ෂණ සිතියම අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති පිටු අංක 04 කඩදාසිය යොදාගන්න.

01. (අ) අංක i සිට iv දක්වා ඇති ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න.

i. සිතියමේ A සිට B දක්වා කඩ ඉරිවලින් දක්වා ඇත්තේ කුමක්ද?(අඩිපාර/දියබෙත්ම/උමං මාර්ගය) (ල.01)

ii. සිතියමේ CD රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක්ද? (අවතල බෑවුම/උත්තල බෑවුම/මොහොර බෑවුම)(ල.01)

iii. E අක්‍ෂරයෙන් සීමා කර ඇති සිතියම් කොටසේ ඇති සංස්කෘතික ලක්‍ෂණයක් වන්නේ,
(ප්‍රධාන මාර්ගය/ වාරි ඇල / තේ වගාව) (ල.01)


iv. F අක්‍ෂරයෙන් සීමා කර ඇති භූ ලක්ෂණය කුමක්ද?
(නෙරුව / නිම්නය / ගංගා නිම්නය) (ල. 01)

v. අංක 01 හා 02 යන වෘක්ෂලතා වර්ග දෙක නිවැරදි අනුපිළිවෙලින් නම් කරන්න. (ල.01)

vi. සිතියමේ දකුණු සීමාව අසල වෘත්තාකාරව දක්වා ඇති කොටස තුළ ඇති සේවා ආයතන දෙකක් නම් කරන්න. (ල.01)

vii. සමස්ත සිතියම් කොටස තුලින් ඔබ හදුනාගත් වතු බෝග වගාවන් නම් කරන්න. (ල.01)

viii. G - H භූ දර්ශනය සඳහා නිවැරදිව දක්වා ඇති හරස්කඩය තෝරා ඊට හිමි අක්‍ෂරය දක්වන්න. (ල.01)




(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ලකුණු 01)
● පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබඳව ඇති තීරුව යොදා ගන්න.

i. A B C යන මුහුදු අතුරින් **''බොෆර්ට් මුහුද'** දැක්වෙන අක්‍ෂරය කුමක්ද?

ii. D E F යන අක්‍ෂර අතුරින් මෑතකදී ලැව්ගිණි වලට ගොදුරු වූ **''ඇමර්සන් වනාන්තරය''** දැක්වෙන අක්‍ෂරය කුමක්ද?

iii. H M N අක්‍ෂර අතුරින් ලෝක කිරිපට්ටි පාලනය සඳහා ප්‍රසිද්ධ වූ **''ඩෙන්මාර්කය''** දැක්වෙන අක්‍ෂරය කුමක්ද?

iv. J K L අක්‍ෂර අතුරින් **''ලීනා''** ගංගාව දැක්වෙන අක්‍ෂරය කුමක්ද?

v. X Y Z යන අක්‍ෂර අතුරින් **''තස්මේනියාව දූපත''** දැක්වෙන අක්ෂරය කුමක්ද? ( ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම අධ්‍යනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයීම සඳහා සිතියම යාබද ඇති තීරුව යොදාගන්න.

i. අංක 01, 02 හා 03 යන නගර අතුරින් **''මීගමුව''** නගරය දැක්වෙන අංකය කුමක්ද?

ii. D E F යන අක්ෂර අතුරින් **'' මහඉලුප්පල්ලම''** වී පර්යේෂණායතනය දැක්වෙන අක්ෂරය කුමක්ද?

iii. A B C අක්ෂර අතුරින් වර්තමනාය වන විට අඩුම ජන සංඛ්‍යාවක් වෙසෙන **''මුලතිව් දිස්ත්‍රික්කය''** සඳහා යොදා ඇති අක්ෂරය කුමක්ද?

iv. J K L යන අක්ෂර අතුරින් **''මැණික් ගඟ''** සඳහා යොදා ඇති අක්ෂරය කුමක්ද?

v. P Q R යන අක්ෂර අතුරින් **''ඉගිණියාගල ජල විදුලි බලාගාරය''** දැක්වෙන අක්ෂරය කුමක්ද?( ලකුණු 05)

## ii කොටස

02. i. පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්ථර තුන දැක්වෙන රූප සටහනක් ඇඳ එහි "කබොල" හා "හරය" යන ස්ථර නම් කරන්න. (ලකුණු 02)


ii. ''කබොල'' යන ස්තරයේ විශේෂ ලක්‍ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. (අ) ජෛව ගෝලයේ ප්‍රධාන සංරචක දෙක නම් කරන්න.
(ආ) පරිසරය තුල ජෛව සාධකයක් හා අජෛව සාධකයක් අතර දක්නට ලැබෙන අන්තර් ක්‍රියාකාරිත්වයක් නම් කර එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. පහත දක්වා ඇත්තේ ග්‍රීක වර්ගීකරණයට අනුව ප්‍රධාන දේශගුණික කලාප දැක්වෙන ලෝක ආකෘති සටහනකි.
එහි A හා B යන දේශගුණික කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. A ලෙස දක්වා ඇති දේශගුණයේ ප්‍රධාන දේශගුණික ලක්‍ෂණ තුනක් සදහන් කරන්න. (ලකුණු 03)

iii. B දේශගුණය තුළ දක්නට ලැබෙන ප්‍රධාන වනාන්තර වර්ගය නම් කොට එහි ලක්‍ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)




04. මිනිස් ආර්ථික කටයුතු අතර නිෂ්පාදන කර්මාන්ත සඳහා සුවිශේෂි ස්ථානයක් ලෙස ලැබී ඇත්තේ එහි ඇති මානව උපයෝගීතාවය ඉතා උසස් මට්ටමක ඇති බැවිනි.

i. ''නිෂ්පාදන කර්මාන්ත'' යන්න අර්ථ දක්වන්න. ( ලකුණු 02 )

ii. මෝටර් රථ කර්මාන්තයේ ප්‍රධාන දකුණු ආසියානු රටක්ද? නැගෙනහිර ආසියානු රටක්ද? ගිණිකොණ දිග ආසියානු රටක්ද? කලාප අනුව, ( ලකුණු 03)

iii. මෝටර් රථ කර්මාන්තයේදී පරිසර හිතකාමී මෝටර් රථ නිෂ්පාදනයට වැඩි නැඹුරුවක් ඇති වෙමින් පවතියි. මෙම කියමන නිදර්ශන සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ල.05)




05. i. යාබද ආසියාතික සිතියම් කොටසේ රබර් වගාව සඳහා ප්‍රසිද්ධ A හා B ලෙස දක්වා ඇති රටවල් දෙක අක්ෂර අනුව නම් කරන්න. (ලකුණු 02)

ii. රබර් වගාව සාර්ථකව ව්‍යාප්ත වීමට නිවර්ථන ආසියාතික රටවල් කීපයක ඇති ප්‍රධාන භෞතික සාධක තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ වතුභෝග කෘෂිකර්මාන්තයේ භූමි පරිභෝගය ආශ්‍රිතව ඇති ගැටලු දෙකක් නිදර්ශන සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

06. i. ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව අප්‍රිකාව හා යුරෝපා මහද්වීප අයත් කරගෙන සිටින ජන සංඛ්‍යා ප්‍රතිශත පහත වගුවෙන් තෝරා මහද්වීපය අනුව නම් කරන්න. (8%, 10%, 16%) (ලකුණු 02)

ii. ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තියේ

(a) ආසියාවේ අධි ජන සංකේන්ද්‍රණයක්ද?

(b) දකුණු ඇමරිකාවේ ද්විතීයික සංකෙන්ද්‍රණයක්ද?

(c) අප්‍රිකාවේ ජන හීන ප්‍රදේශයක්ද? අක්ෂර අනුව නම් කරන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමතුලිත තාවයට හේතු වූ භෞතික සාධකයක් ද මානුෂිය සාධකයක් ද කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. i. පාරිසරික අනවබෝධය නිසා ඇතැම් විට මානවයා '' උපද්‍රව්‍යයන්'' නිර්මාණය කරගෙන ඇත. පරිසරය තුළ එසේ හඳුනාගත් උපද්‍රවයක් නම් කර එයින් සිදුවිය හැකි ආපදාවක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ''ලැව්ගිණි ආපදාව'' ඇති වීමට බලපාන ස්වාභාවික හේතු දෙකක්ද මානුෂිය හේතුවක්ද සඳහන් කරන්න. ( ලකුණු 03 )

iii. (අ) ජල ගැලීම් බහුල වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

(ආ) ජල ගැලීම් අවම කර ගැනීමට අනුගමනය කල යුතු එක් ක්‍රියාකාරකමක් විස්තර කරන්න. (ලකුණු 05 )

08. i. දේශගුණික වෙනස්වීම් යන්න අර්ථ දක්වන්න. ( ලකුණු 02 )

ii. දේශගුණික වෙනස්වීම් නිසා මානව කටයුතු වලට ඇතිවන බලපෑම් තුනක් සඳහන් කරන්න. ( ලකුණු 03 )


iii. දේශගුණික වෙනස්කම් අවම කිරීමට ශ්‍රී ලංකාව දායක වී ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

* * * * * * *

භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

11 ශ්‍රේණිය
**Grade 11**


01. (අ) (அ) (a)




SCALE 1 : 50,000


සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres

01. (ආ) (ஆ) (b)




| | |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |
| | 5 |

01. (ඉ) (இ) (c)




| | |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |
| | 5 |

01. (අ) (அ) (a)

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා |
|---|

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(iii) ..........................................................................................................

(iv) ..........................................................................................................

(v) (1)..........................................................................................................

(2)..........................................................................................................

(vi) (a)..........................................................................................................

(b)..........................................................................................................

(vii) ..........................................................................................................

(viii) ..........................................................................................................

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# භූගෝල විද්‍යාව- පිළිතුරු පත්‍රය

## 11 ශ්‍රේණිය

### i කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | මෙසෝ | 11 | වැරදි | 21 | මොහොරෝ විසික් | 31 | 1 |
| 02 | සාගර | 12 | නිවැරදි | 22 | ටිබෙට් | 32 | 2 |
| 03 | සංවහන ධාරා | 13 | නිවැරදි | 23 | කිවුල් දිය | 33 | 4 |
| 04 | සැක්‍රමැන්ටෝ | 14 | වැරදි | 24 | කෙයොලීන් | 34 | 2 |
| 05 | කුරුණෑගල | 15 | නිවැරදි | 25 | සංක්‍රමණ | 35 | 2 |
| 06 | ඇ.එ.ජන | 16 | 1 | 26 | මර්කේටර් හරස් | 36 | 2 |
| 07 | බැසෝල්ට් | 17 | 2 | 27 | කොළඹ | 37 | 3 |
| 08 | ගල්ඔය | 18 | 3 | 28 | නුවරඑළිය | 38 | 4 |
| 09 | මධ්‍යම | 19 | 4 | 29 | මොරටුව | 39 | 3 |
| 10 | සැබෑ | 20 | 2 | 30 | කොළඹ | 40 | 4 |

### ii කොටස

01. (අ) i. දියබෙත්ම ii. අවතල බෑවුම iii. වාරි ඇළ iv. ගංගා නිම්න

v. 1 වනාන්තර 2. ලඳුකැලෑ vi. පාසල/ තැපැල් කාර්යාලය/ රෝහල vii. පොල් viii. x

(ආ) i. A ii. D iii. M iv. K v. Y ( ලකුණු 05 )

(ඉ) i.2 ii. F iii. B iv. L v. R ( ලකුණු 05 )

02. (i) මෙම හරස්කඩ පමණක් නොව ගෝලය තුල මෙම ස්ථර දක්වා ඇත්නම් එයද නිවැරදි පිළිතුරකි.

ii. 10 පෙළපොත 11 පිටුව ( ලකුණු 03 )

iii. (අ) ශාක සහ සතුන් ( ලකුණු 02 )

(ආ) ⋆ ප්‍රභාසංස්ලේශණය ( ශාකය හා හිරු එළිය + $co_2$ ) ⋆ ශාකය වැඩීම ( ශාකය හා පස + ජලය )

⋆ සතුන් ආහාර ගැනීම ( සත්වය + ජලය ) වැනි අන්තර් ක්‍රියා දක්වා ඇත්නම් ලකුණු දෙන්න. (ල.03)

03. i. A - නිවර්තන දේශගුණික කලාපය B - සෞම්‍ය දේශගුණික කලාපය ( ලකුණු 02 )

ii. 10 පෙළ පොත 28 පිටුව බලන්න. ( ලකුණු 03 )

iii. සෞම්‍ය කලාපීය වනාන්තර නම් කිරීම ( ලකුණු 01 ) වනාන්තරවල ලක්ෂණ දෙකක් විස්තර කිරීම ( ලකුණු 04 ) ( පෙළ පොත 14 පිටුව )

04. i. " මිනිසා සතු ශිල්පීය හා තාක්ෂණික ඥානය භාවිතා කරමින් නිෂ්පාදන අමුද්‍රව්‍යය හා අනෙකුත් සාධක යොදා නිමි හෝ අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදනයයි. ( මෙවැනි අර්ථ දැක්වීමක් සඳහා ලකුණු 02 දෙන්න.)

ii. ⋆දකුණු ආසියාව - ඉන්දියාව ⋆නැගෙනහිර ආසියාව - ජපානය/ කොරියාව/ චීනය

⋆ගිණිකොණ දිග ආසියාව - මැලේසියාව/ තායිලන්තය

iii. ඉන්ධන පිරිමැසුම් මෝටර් රථ නිෂ්පාදනය

දෙමුහුන් මෝටර්රථ නිෂ්පාදනය විදුලි මෝටර්රථ නිෂ්පාදනය

පරිසර හිතකාමී මෝටර්රථ නිෂ්පාදනය

සැහැල්ලු මෝටර්රථ නිෂ්පාදනය ( මෙවැනි කරුණක් විස්තර කිරීම අපේක්ෂිතයි) ( ලකුණු 05 )

05. i. A - තායිලන්තය

B - වියට්නාමය

ii. 27c ක පමණ ඉහළ උෂ්ණත්වය

2000 mm පමණ වර්ෂාපතනය

ලැටරයිට් කබොක් මිශ්‍ර රතු පස්

මද බෑවුම් ඉඩම්

iii. ඉඩම් කැබලිවීම

වෙනත් මානව කටයුතු සඳහා යොදා ගැනීම

බිම් නිසරු වීම

බොහෝ වතු භෝග වගාවන් කල්ගත වීම

06.

i. 16% - අප්‍රිකාව

10% - යුරෝපය

ii. A - දකුණු ආසියාව/ නැගෙනහිර ආසියාව/ ගිණිකොණදිග ආසියාව

B - නැගෙනහිර වෙරළබඩ කලාපය

C - සහරා කාන්තාර ප්‍රදේශ / කොංගෝ වනාන්තර ප්‍රදේශ

iii. භෞතික සාධක :- තැනිතලා බිම්, ජල පහසුව, වෙළ මායිම්, උෂ්ණත්වය, ඛණිජ ව්‍යාප්තිය, දළ බෑවුම්

මානව සාධක :- සංවර්ධනය, යටිතල පහසුකම්, ආරක්ෂාව, නාගරික පහසුකම්. කර්මාන්ත ව්‍යාප්තිය

07.

i. උපද්‍රවයන් හා ආපදාවන් :-

බෑවුම් ඉඩම් වල නිවාස තනාගැනීම. - නායයෑම්

වෙරළ අයිනේ ඉදිකිරීම් - සුනාමි

වේගයෙන් රිය පැදවීම - අනතුරු වීම්.

අනාරක්ෂිත ප්‍රදේශවල මානව කටයුතු

ජල හිග ප්‍රදේශවල වගා කිරීම - නියඟය

ගංගා පිටාර තැන්නේ කෙරෙන මානව කටයුතු - ජල ගැලීම් (ලකුණු 02)

ii. ස්වාභාවික හේතු :- දැඩි සූර්ය රශ්මිය / සුළං / අකුණු සැර / ගිණිකඳු විදාරණය

මානුෂීය හේතු :- ගිණි තැබීම් / නොසැලකිල්ල මත සිදුවන ගිනි තැබීම් (ලකුණු 3)

iii. (අ) 11 පෙළපොතේ 105 පිටුව

(ආ) 11 පෙළ පොතේ 105 පිටුව

08.

i. පැවති දේශගුණික ස්භාවයන් කෙටි කාලීනය වෙනස්වීම හා එයින් අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීමයි

ii. 11 පෙළපොත 117 හා 118 පිටු

iii. 11 පෙළපොත 119 පිටුව